# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2092/39 – 2018 ඔක්තෝබර් මස 10 වැනි බදාදා – 2018.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීමේ නියෝගය

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතින් හා බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 02(2) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම් සහ කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍ය කැප්ටන් ලලිත් වනිගරත්න වන මම බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සහයවීම පිණිස පත්කර ඇත්තා වූ පහත සඳහන් අංක I වැනි උපලේඛනයේ II වැනි තීරුවේ තනතුර සඳහන් I වැනි තීරුවේ නම් සඳහන් තැනැත්තන් වෙත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 02(2) වගන්තිය යටතේ හා එකී ප්‍රඥප්තියේ 72(2) වගන්තියේ විධිවිධාන අනුව වලංගු සමුපකාර සමිති රීති මාලාව යටතේ බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරී ඇති පහත දැක්වෙන එකී උපලේඛනයේ IV වැනි තීරුවේ සඳහන් සියලුම බලතල එකී උපලේඛනයේ III වැනි තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

**කැප්ටන් ලලිත් වනිගරත්න,**
මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ,
නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම් සහ
කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍ය,
බස්නාහිර පළාත් සභාව.

2018 සැප්තැම්බර් මස 26 වැනි දින,
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
බත්තරමුල්ල දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1 වැනි උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* | *IV වැනි තීරුව* |
|---|---|---|---|
| (1) රුවිනි ආයාචනා විජයවික්‍රම | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ශ්‍රී ලං. ප. සේ. III) | 2018.09.07 | බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ අංක 02(3), 4, (4(2) හැර), 6, 7, 8, 33, 43(අ), 43(ආ), 44, 45, 46, 47, 50, 52, 53, 54 (54(2) හැර), 58(2), 59, 67, 68, 69, 74 හා 76 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල සහ සමුපකාර රීති මාලාවේ 4, 11, 15, 16(II), 19, 22(II), 27, 32, 37, 39, 40, 41, 42, 49, 52 හා 53 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල. |

10 – 1350

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.